

# වෘත්ත මාලාඛ්‍යාව



# වෘත්තමාලාඛ්‍යාව.

**නමස්තස්සෙ භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

1) ශ්‍රීඝනකමලජමමලං—
ජයතාත් සද්ධර්ම පූර මධුපූර්ණං
හරිහරහිරණ්‍යගර්භ—
ප්‍රභෘතිභ්‍රමරාවෘතං සතතං.

පථ්‍යා යනාම.

**ශ්‍රීඝන කමලජං ජයතාත්** යනුමෙහි ක්‍රියාකාරක **පද සම්බන්ධයි— සම්‍යක්සම්බුද්ධ** නමැති පද්මයතෙම **සර්වෝත්කර්ෂයෙන්** පවතීවා. කිංවිශිෂ්ටං ශ්‍රීඝන කමලජ මිතිචෙත්— කිමකින් විසිතුරුවූ **සම්‍යක්සම්බුද්ධ නමැති පද්මයෙක්දයත්.**

**සද්ධර්මපූර,** සපර්‍යාප්තික නවලොකොත්තර **සද්ධර්ම**නමැති; මධුපූර්ණං, පුෂ්පරසයෙන් හරිත වූ; සතතං, අනවරතයෙන්; හරිහර හිරණ්‍ය ගර්භප්‍රභෘති විෂ්ණු මහෙශ්වර බ්‍රහ්මාදිවූ සමස්ත **දෙවතා** නමැති; භ්‍රමරාවෘතං, භෘංගයන්විසින් පිරිවරණලද; අමලං, අත්‍යන්තපරිශුද්ධ මාර්ගඥානයෙන් සමුද්ඝාතහෙයින් නිර්මලවූ; ශ්‍රීඝනකමලජං, රූපකාය ධර්මකාය සම්පත්තියෙන් සාන්ද්‍රවූහෙයින් ශ්‍රීඝනනම්වූ සර්වඥනමැති පද්මයතෙම; ජයතාත්, සද්ගුණසුගන්ධ ව්‍යාප්තියෙන් විජෘම්භිතව **පරහිත** භවනය කෙරේවා.

(2) කවයස් සන්ති ජගත්‍යාම්—
බහවඃ කවයස්තු නාමතෙ තෙඃ කිමෙමි
යෙ ගුණදොෂවිධිඥා—
විරලාස් තෙ සාධවස්තු සරසාඃ ප්‍රායඃ.

ආර්‍යාගීති නාම.

ජගත්‍යාම්, සර්වලොකයෙහි; බහවඃ කවයඃ, බොහෝ කවිජනයෝ; සන්ති, ඇත්තාහ; තෙ, ඒ නාමධාරීවූ කවිසමූහයෝ; කවයස්තු නාම, ප්‍රතිභාවූ රූපයෙන් පද්‍යරචනාකලාභූවෙත්; තෙඃ, ඒ අල්පශ්‍රැත විරස කවිජනයාගෙන්; මෙ, මට; කිං, කවර ප්‍රයෝජනයෙක්ද; යෙ, යම් කවිවරකෙනෙක්; ගුණදොෂවිධිඥාඃ, පදවාක්‍ය වාක්‍යාර්ථයෙහි ගුණදොෂවිධාන දන්නාහුද; සරසාඃ, රසභාවයෙන් යුක්තාවූව හුද; තෙසාධවස්තු, ඒ ප්‍රශස්තකවිවරයෝ වනාහි; ප්‍රායඃ, බොහෝසෙයින්; විරලාඃ, තුනීවන්නාහුයි.

(3) අස්ති සි නවරත්න පූරිතා—
නගරී ලඞ්කානාම විශ්‍රැතා
විලසච්චතුරබ්ධි මෙඛලා—
විබලා විබුධාලඞ්කෘතොදරා.

වෛතාලීය නාම.

(4) මුනීන්ද්‍ර පාදාබ්ජ පූජන—
ප්‍රවීණෙන ගුරුණා සමාභෘතාං
පරාක්‍රම භුජේන භූභුජා—
ප්‍රපාලිතා සුනයෙන සන්මුදෙ.

දක්ෂිණාන්තිකා නාම.

නවරත්නපූරිතා, පද්මරාගවෛදූර්‍ය්‍ය නීලම්රකතාදි නවවිධරත්නයෙන් සම්පූර්ණවූ; විලසත් නෙවූතාවූ; චතුරබ්ධි මෙඛලා, චතුස්සාගර නමැති මෙඛලාදාමයෙන් යුක්තාවූ; විබලා, චොරධූර්තාදි දුර්ජනයන්රහිතවූ; විබුධාලඞ්කෘතොදරා, උත්පලවර්ණ සුමනසමණිමුඛාදි දිව්‍යරාජයන්විසින් හෝ නොහොත් සමස්ත ශාස්ත්‍රයෙහි නිපුණ විචක්ෂණයන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ අභ්‍යන්තරප්‍රදෙශ ඇති.

මුනීන්ද්‍ර, මුනිරාජන්වූ සම්‍යක්සම්බුද්ධ රාජෝත්තම යානන්වහන්සේගේ; පාදබ්ජපූජන, ශ්‍රීපාදපද්ම යට පූජාකිරීමෙහි; ප්‍රවීණතා, දක්ෂවූ; සෞම්‍යතාං, සෝම්‍ය සුශීලාංශයෙන්හුනුවූ රජදරුවන්ට; ගුරුණා, ශික්ෂාදායකත්වයෙන් ගුරුභූතවූ; පරාක්‍රමභූජේන, ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී පරාක්‍රමබාහු නම්වූ; භූභුජා, මහරාජෝත්තමයාවිසින්; සන්මූද, සත්පුරුෂයන්ගේ සන්තෝෂවර්ධනය පිණිස; සුනයෙන, යහපත්වූ නීතිමාර්ගයෙන්; ප්‍රපාලිතා, දුෂ්ටනිග්‍රහ ශිෂ්ටපරිපාලනය කිරීමෙන් ප්‍රකර්ෂයෙන් රක්ෂාකරණලද්දාවූ; විශ්‍රුතා, ලොකප්‍රසිද්ධවූ; ලඞ්කානාමකනගරී, ලංකානම්වූ පුරියක් නොමෙර්; අස්තිසි, කාලත්‍රයෙහි විද්‍යමාන වන්නී වැයි.

(5)

තත්‍රාම්‍රපනසෛඃ පූගෛරාම්‍රාතකමධුද්‍රුමෛඃ
කදලී නාලිකෙරෙක්ෂු ලවලී කොලි දාඩිමෛඃ.

තත්‍ර, ඒ සිංහලවීපයෙහි; ආම්‍රපනසෛඃ, අඹගස්හා පනාගසින්ද; පූගෛඃ, පුවක්ගසින්ද; ආම්‍රාතකමධුද්‍රුමෛඃ, ඇඹරුලගසින්හා මීගසින්ද; කදලී, කෙසෙල්ගසින්ද; නාලිකෙර, පොල්ගසින්ද; ඉක්ෂු, උක්ගසින්ද; ලවලී, ලාවුළුගසින්ද; කොලි, ඩෙබරගසින්ද; දාඩිමෛඃ, දෙළුම්ගසින්ද.

(6)

ලවඞ්ගනාගපුන්නාග නාගරඞ්ගාම්ල වේතසෛඃ
ජම්බුදුම්බර ජම්බීරෛර් බීජපූර කපිත්ථකෛඃ.

ලවඞ්ග, ලමිගගස; නාගපුන්නාග, නාගස් හා දෙඹගස; නාගරඞ්ග, නාරංගස; අම්ලවේතසෛඃ, ගොරකගස යනාමෙසින්ද; ජම්බු, දඹගා; උදුම්බර, දිඹුල්; ජම්බීරෛඃ, දොඩම්ගසින්ද; බීජපූර, ලප්නාරංගා; කපිත්ථකෛඃ, දිවුලෙන්ද.

(7)

තමාල තාල හින්තාලෛශ් ශ්‍රීඵලාමල පාටලෛඃ
කිංශුකාශොක වකුලෛඃ පිචුමන්ද හලිප්‍රියෛඃ.

තමාලතාලහින්තාලෛඃ, තමළුය තල්ය කිතුල්ය යනාමෙසින්ද; ශ්‍රීඵලාමලපාටලෛඃ, බෙලිය ඇඹුලුය පළොල්ය යනාමෙසින්ද; කිංශුකාශොකවකුලෛඃ, කැලය හොපලුය මුනුළුය යනාමෙසින්ද; පිචුමන්ද හලිප්‍රියෛඃ, කොසඹගස්හා බක්මීගයන්ද.

(8)

ශිරීෂ පිලු මන්දාරෛර් ලිකුචෛඃ කරමර්දකෛඃ
කෙතකීකොවිදාරෛශ්ච පියාලසරලාශනෛඃ.

ශිරීෂ, මහරිගස; පිලු, පලුගස; මන්දාරෛඃ, මදුරාස යනාමෙසින්ද; ලිකුචෛඃ, දෙසිගසින්ද; කරමර්දකෛඃ, කරඹගසින්ද; කෙතකී, වැටකේගසින්ද; කොවිදාරෛශ්ච, කොබෝලිලගසින්ද; පියාල, මොරගසින්ද; සරල, හොරගසින්ද, අශනෛඃ, පියාගසින්ද.

(9)

නානාපුෂ්පලතායොෂිදාලිඞ්ගන විජෘම්භිතෛඃ
භ්‍රමද්භ්‍රමරඣඞ්කාරෛඃ කූජත්කොකිල
සෙවිතෛඃ.

නානාපුෂ්පලතායොෂිත්, අනෙකප්‍රකාරවූ මාධවීමාලතාදි කුසුම් ලියනමැති ස්ත්‍රීයන්ගේ; ආලිඞ්ගන, වැළඳීමෙන්; විජෘම්භිතෛඃ, පල්ලවමුකුලාදීන්ගේ උද්ගමය ඇතිව පැලඹෙන්නාවූ; භ්‍රමත්, භූවරදපොලින් බමන්නාවූ; භ්‍රමර, බඹරුන්ගේ; ඣඞ්කාරෛඃ, ඣංයන අනුකරණශබ්දහා; කූජත්, රාවපිළි රාවදෙන්නාවූ; කොකිල, කොවුලන් විසින්; සෙවිතෛඃ, සෙවුනාලබන්නාවූ.

(10)

නානාපක්ෂිකුලාක්‍රාන්තෛඃ නෘත්‍යද් බර්හිණ
මණ්ඩලෛඃ
ලීලොද්‍යාන සරිද්වාපී පවනොද්ධුත පල්ලවෛඃ.

නානාපක්ෂිකුල, ගිරා සැළලිහිණි ආදිවූ නොයෙක් පක්ෂිසමූහයා විසින්; ආක්‍රාන්තෛඃ, ගැවසීගත්තාවූ; නෘත්‍යද්, පිංජාවතීනය කරන්නාවූ; බර්හිණමණ්ඩලෛඃ, මොනරමඬුළු ඇති; ලීලොද්‍යාන, ක්‍රීඩාරාමයෙන් එක්නාවූද; සරිද්වාපී, ක්‍රීඩානදියෙන් හා පොකුණුවිලින් එක්නාවූද; පවන, මන්ද සෞරභ්‍යශෛත්‍ය යන ගුණත්‍රයෙන් යුක්තවූ මාරුතයෙන්; උද්ධුත, කම්පාකරණලද; පල්ලවෛඃ, ලපළපන් ඇති.

(11) ජලෛඃ පුන්නාගකුසුමෛර්
විභිතාභිවිභෂිත්‍රිතෛඃ
චම්පකාශොකශව යරැහිස්
සමන්තාත් පරිපූරිතෛඃ

ප්‍රත්‍යග්‍රකුසුමෛඃ, අභිනවප්‍රබුද්ධකුසුමයෙන්ද; චිත්‍රිත, කරණලද්දාවූ; අත්පිසන්ක්‍රියෛඃ, ආගන්තුකසත්කාරඇති; එලෛඃ, ගෙඩියෙන්ද; චම්පකාම්‍රෛඃච, සපුගස්ආදිවූ; තරුභිඃ, වෘක්ෂයන්විසින්ද; සමන්තාත්, හාත්පස්හි; පරිවාරිතෙ පිරිවරණලද්දාවූ;—

(12)

විචක්ෂණ සමාකීර්ණේ රම්‍යවේශ්ම විභූෂිතෙ
භාසුරෙ ප්‍රමදාරත්නෛ ර්ධනධාන්‍ය සමන්විතෙ.—

විචක්ෂණ, තර්කව්‍යාකරණ කාව්‍යනාටකාදි සකලශාස්ත්‍රයෙහි දක්ෂවූ පණ්ඩිතවරයන් විසින්; ස[illegible] කීර්ණේ, ගැවසීගත්තාවූ; රම්‍යවේශ්ම, මනොඥවූ වාසභවනයෙන්; විභූෂිතෙ, අලඞ්කෘතවූ; ප්‍රමදාරත්නෛඃ, උත්තම ස්ත්‍රීජනයාවිසින්; භාසුරෙ, බබලනාලුවූ; ධනධාන්‍යසමන්විතෙ, මුක්තාමාණික්‍යාදි ධනයෙන් හා ශාලිව්‍රීහ්‍යාදි ධාන්‍යයෙන් යුක්තවූ—

(13)

ප්‍රභාවිත ගොපුරත්‍රිණාංශවොධනීනාංසහස්‍රශඃ
ස්තන්‍යපානෙච්ඡුවත්සානාං ගම්භීරවසමාකුලෙ.—

ශවොධනීනාං, කලපුරණ කිරිබුරුළු ඇති; සහස්‍රශඃ, දහස්ගණන්; ගොපුරත්‍රිණාං, කරදගාන්ගේ; ප්‍රභාවිත, උදයකාලයෙහි; ස්තන්‍යපානෙච්ඡුවත්සානාං, තනෙහි කිරිබොනු කැමැත්තාවූ ලමාවස්සන්ගේ; හම්භාරවසමාකුලෙ, හම්භාරව අනුකරණයෙන් ගැවසගත්තාවූ—

(14) ඡාත්‍රාණාං වර්ණශාලායාං—
නානාශාස්ත්‍රාණ්‍යධීතිනාං
යුක්තෛඃ පරස්පරාලාපෛර්—
මුඛරීකෘත දිඞ්මුඛෙ.—

වර්ණශාලායාං, අක්ෂරශාලාවෙහි; නානාශාස්ත්‍රාණි, නොයෙක් ශාස්ත්‍රයන්හි; අධීතිනාං, හදාරන්නාවූ; ඡාත්‍රාණාං, ශිෂ්‍යයන්ගේ; යුක්[illegible] ශබ්දාර්ථ යුක්ති සහිතවූ; පරස්පරාලාපෛඃ, අන්‍යොන්‍ය සම්භාෂණයෙන්; මුඛරීකෘත, ශබ්දමත් කර[illegible] ලද දිඞ්මුඛෙ, දිශාමුඛඇති—

(15)

ප්‍රූෂිත සම්බුද්ධසදනෙ 'රුම්ග්‍රාමාභිධෙ ශුභෙ
ග්‍රාමෙ පරම්පරායාතෙ ලඞ්කාතිලකනාගතෙ.—

සම්බුද්ධසදනෛඃ, සර්වඥප්‍රතිමාගෘහයෙන්; ප්‍රූෂිතෙ, අතිපවිත්‍රවූ; ලඞ්කාතිලකතාගතෙ, ශ්‍රීලඞ්කාද්වීපනමැති කාන්තාවගේ තිලකාභරණස්ථානයට පැමිණියාවූ; ශුභෙ, මනොඥවූ; උම්ග්‍රාමාභිධෙ, උම්ගමුනම්වූ; පරම්පරායාතෙග්‍රාමෙ, කුලපරපුරෙන් පැවතිගම්හි—

(16)

ගුණවාන් ධනවාන් වාග්මී රූපනිර්ජිතමන්මථඃ
විද්‍යාවිනය සම්පන්නො මහාකුලසමුද්භවඃ—

ගුණවාන්, ශීලාචාරාදි ප්‍රශස්ත ගුණයෙන් යුක්තවූ; ධනවාන්, මණිකනක රජතාදි බොහෝ ධනයෙන්යුක්තවූ; වාග්මී, වාචොයුක්ති දක්ෂවූ; රූප, රූපසෞන්දර්‍ය්‍ය ශරීරයෙන්; නිර්ජිත, පරදවනලද; මන්මථඃ, අනඞ්ගයා ඇති; විද්‍යාවිනය සම්පන්නඃ, ඉතිහාසපුරාණාදි විද්‍යාවෙන්හා සදාචාර ගුණයෙන් යුක්තවූ; මහාකුලසමුද්භවඃ, පූජ්‍යකුලයෙහි උපන්නාවූ—

(17)

සර්වඥ චරණාම්භොජ භ්‍රමරඃ පරවීරහා
අභූද් වික්‍රම සිංහාඛ්‍යො වික්‍රමාර්ජිත සද්‍යශාඃ—

සර්වඥ, සම්‍යක් සම්බුද්ධරාජොත්තමයාණන් වහන්සේගේ; චරණාම්භොජ, ශ්‍රීපාදපද්මයට; භ්‍රමරඃ, [illegible] සමානවූ; පරවීරහා, ශත්‍රුවීරයන් [illegible]; වික්‍රමාර්ජිත, බාහුබලවික්‍රමයෙන් [illegible] ලද; සද්‍යශාඃ, යහපත් කීර්තිඇති; වික්‍රම [illegible] වික්‍රමසිංහදෙවයාම් උත්තමපුරුෂයෙ [illegible], වූයේයි—

(18)

සහි සර්වගුණොපෙතාං පූර්ණලක්ෂණ ලක්ෂිතාං
ගුරුශුශ්‍රූෂණෙරක්තාං ශීලාචාර පරායණාං.—

සහි, ඒ වික්‍රමසිංහනම් උත්තම පුරුෂයා වනාහි; සර්වගුණොපෙතාං, සියලු ප්‍රශස්තගුණයෙන් යුක්තවූ; පූර්ණලක්ෂණ ලක්ෂිතාං, මහානසීලක්ෂණයෙන් ප්‍රසිද්ධවූ; ගුරුශුශ්‍රූෂණෙරක්තාං, මව්

පිය බෑබුන් ආදිවූ කුලඅඳටුවන්ට අත්පා මෙහෙ කිරීමෙහි ඇලුම් ඇත්තාවූ; ශීලාචාරපරායණාං, විශුද්ධ ශීලාචාර ධර්මය ප්‍රතිෂ්ඨාකොට ඇති෴

( 19 )

පද්මපත්‍රවිශාලාක්‍ෂිං සදා මධුර භාෂිණීම්
පූර්ණෙන්දුවදනාං තන්වීං සුදතිං
තනුමධ්‍යමාම්෴

පද්මපත්‍රවිශාලාක්‍ෂිං, පියුම්පතක්මෙන් පුළුල් ඇස්ඇති; සදා, හැමකල්හි; මධුරභාෂිණීං, ප්‍රිය තෙපුල් කියන්නාවූ; පූර්ණෙන්දුවදනාං, සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලයට බඳුවූ මුඛ ඇති; තන්වීං, කෘශානවූ; සුදතිං, ශොභනවූ දන්තපන්ති ඇති; තනුමධ්‍යමාං, සිහින්වූ මධ්‍යප්‍රදෙශ ඇති෴

( 20 )

ශ්‍යාමාං ගජෙන්ද්‍රගමනාං සලජ්ජාං චාරුභාෂිණීම්
පාර්තීමිව රූපෙණ සෞභාග්‍යෙන ශචීමිව෴

ශ්‍යාමාං, සාමවන්වූ; ගජෙන්ද්‍රගමනාං, හස්තිනියට බඳුවූ ලීලොපෙත ගමන්ඇති; සලජ්ජාං, ලජ්ජාසහිතවූ; චාරුභාෂිණීං, මනොඥවූ කථායෙන් යුක්තවූ; රූපෙණ, රූපයෙන්; පාර්තීමිව, පරමෙශ්වරිය වැනිවූ; සෞභාග්‍යෙන යහපත් ගුණයෙන්; ශචීමිව, ඉන්ද්‍රාණිය වැනිවූ෴ ශ්‍යාමා යෞවන මධ්‍යස්ථා, යොවුන් මැද සිටියා ශ්‍යාමා නමු–උත්පලමාලාකොෂයි෴

( 21 )

ජම්බුද්‍රොණීපුරස්ථස්‍ය දන්තානුක්තාග්‍ර සම්පදඃ
ශ්‍රීමතඃ ප්‍රතිරාජස්‍ය ජයසිංහස්‍ය පුත්‍රිකාම්෴

දන්තානුක්තාග්‍රසම්පදඃ, තෲගයට පමුණුවන ලද හා වලඳනාලද උතුම්වූ සැපත්ඇති; ජම්බුද්‍රොණීපුරස්ථස්‍ය, දඹදෙණිනුවර වාසයකරන්නාවූ; ශ්‍රීමතඃ, යසපිරිවර සමෘද්ධියෙන් යුක්තවූ; ජයසිංහස්‍යප්‍රතිරාජස්‍ය, ජයසිංහ ප්‍රතිරාජයන්ගේ; පුත්‍රිකාං, දූවූ෴

( 22 )

දෙවීමාභරණීසංඥං සර්වාභරණ භූෂිතාම්
ජනතාහ්ලාදජනනීමුපයෙමෙ යථාවිධි෴

ජනතා, ගුරුභෘත්‍යාදී සර්වජනයාට; ආහ්ලාදජනනිං, සන්තොෂ උපදවන්නාවූ; සර්වාභරණභූෂිතාං, කනකකටකනූපුරාදි සර්වාභරණයෙන් සැරහුනාවූ; ආභරණීසංඥංදෙවීං, ආභරණවතී නම්වූ දෙවිය; යථාවිධි, ශාස්ත්‍රොක්තවිවාහ ක්‍රමයෙන්; උපයෙමෙ, පාණිග්‍රහණය කෙළේයි෴

( 23 )

ස තස්‍යාං ජනයාමාසීත් සුතමුත්තමලක්‍ෂණම්
විශ්වනාථරමහාරාජං පුෂ්පත්‍යාමිව සඤ්ජයඃ෴

සඃ, ඒ උමගමු වික්‍රමසිංහදෙවතෙම; තස්‍යාං, ඒ ආභරණවතීනම් දෙවිය කෙරෙහි; උත්තමලක්‍ෂණං, ත්‍රිවිශාල ෂඩුන්නත සප්තරක්තාදි උත්තම පුරුෂලක්‍ෂණයෙන් යුක්තවූ; සුතං, පුත්‍රරත්නයක්; ජනයාමාසීත්, ඉපදවූයේය; කවරක්හු මෙන්ද෴ සඤ්ජයඃ, සඤ්ජය මහරජතෙම; පුෂ්පත්‍යාං, පුසතීදෙවිය කෙරෙහි; විශ්වනාථරමහාරාජංඉව, වෙසතුරු මහරජහු මෙනි෴

( 24 )

තතස්තමකරොත් නාම්නා විජයං ජනකො
ජීවිත්
භවිතේති තමායුෂ්මාන් ලොකෙ මාරජයාස්
පදං෴

තතඃ, ඉක්බිත්තෙන්; ආජීවිත්, ශබ්දාර්ථදන්නාවූ; ජනකඃ, පිතෘවූ වික්‍රමසිංහ දෙවතෙම; ආයුෂ්මාන්, ආයුබොහෝවූ කුමාරතෙම; ලොකෙ, මනුෂ්‍යලොකයෙහි; මාරජයාස්පදං, මාර; යන් ජයගන්නාවූ පදවියෙහි පිහිටියේ; භවිතා ඉති, මතුවන්නේයයි සිතා; තං, ඒ කුමාරයා, නාම්නා, නම්කරණකොටගෙණ; විජයං, විජය නමින් යුක්තවූවහු; අකරොත්, කොළේයි෴

( 25 )

සතතාන මුදං පිත්‍රොර්වර්ධමානො දිනෙ දිනෙ
තනයශ් ශරජන්මෙව පාර්තී චන්ද්‍රමූර්තිනොඃ෴

සඃතනයඃ, ඒ කුමාරතෙම; දිනෙ දිනෙ, දවසක් දවසක් පාසා; වර්ධමානඃ, වැඩෙන්නේ; පිත්‍රොඃ මව්පිය දෙදෙනාට; මුදං, සන්තොෂය; තතාන

කෙළේයි; කවරක්හු මෙන්ද... පාණිනිචන්ද්‍රමුඛීනොඃ, උමාමහෙශ්වර දෙදෙනාට; ශරජන්මෙව, සකන්දකුමාරයා මෙනි.

( 26 )

කාලෙනකියතා මුක්තශෛශවොභවමුක්තයෙ
සම්බුද්ධශාසනෙ ගුඩෙ විධිනා ප්‍රාව්‍රජෙත් සුධීඃ

කියතාකාලෙන, කතිපය කාලයකින් හෙවත් දෙළොස්හැවිරිදිකාලයෙහි; මුක්තශෛශවඃ, හරණලද බාල බව ඇත්තාවූ; සුධීඃ, අක්ෂරාභ්‍යාසයෙන් බුද්ධිමත්වූ; සඃ, ඒ විජයකුමාරතෙම; භවමුක්තයෙ, සංසාරයෙන් මිදෙනු පිණිස; ගුඩෙ, නිර්මලවූ; සම්බුද්ධශාසනෙ, සර්වඥශාසනයෙහි; විධිනා, ශාස්ත්‍රක්‍රමයෙන්; ප්‍රාව්‍රජෙත්, පැවිදිවූයේයි.

( 27 )

සචීවරෙණ බාලාකී පලලවය්පර්ධිනා මුනිඃ
බභෞපලාශ ශාඛීව කුසුමෛඃ සකන්ධසඞ්ගතඃ

සඃමුනිඃ, ඒ මුනිකුමාරතෙම; බාලාකීපලලවස්පර්ධිනා, තරුණසූර්‍ය්‍යාද අභිනවපලලවයන්ද ස්පර්ධාකරණ සුළුවූ; චීවරෙණ, පොරොණාපළඳනා චීවරයන්කරණකොටගෙණ, බභෞ, බැබලුනේසි; කුමක්මෙන්දයත්... ස්කන්ධසඞ්ගතඃ, කඳුපතරට පැමිනියාවූ; කුසුමෛඃ, පුෂ්පයන්කරණකොටගෙණ; පලාශශාඛීව, බාල කැලගසක්මෙනි.

( 28 )

තං ශෛලාන්තර මූලෙශො මහාස්වාමි ජිනො
දිතෛඃ
මන්ත්‍රෛස් සංස්කෘත්‍ය විධිව්ද්‍වක්‍රෙ
දීපඞ්කරාව්හයං

ශෛලාන්තරමූලෙශඃ මහාස්වාමී, ශෛලාන්තරමූලමහාස්වාමීතෙම; ජිනොදිතෛඃ, සර්වඥප්‍රොක්තවූ; මන්ත්‍රෛඃ, සරණාගමන ශික්ෂාපදාදිප්‍රවචනමන්ත්‍රයෙන්; තං, ඔහු; විධිවත්සංස්කෘත්‍ය, විදිසේ සංස්කාරකොට හෙවත් ශීලාචාරාදිගුණයෙහි පිහිටුවා; දීපඞ්කරාහ්වයං, දීපංකරනමින් ප්‍රසිද්ධවූ වභ්‍රු, චක්‍රෙ, කෙළේයි.

( 29 )

අථතද්ගුණ සංතුෂ්ටා යතීන්ද්‍රාස් තත්තපොධනං
ප්‍රාපයනොපසම්පත්තිං ජිනශාසන වෘද්ධයෙ

අථ, ඉක්බිත්තෙන්; තද්ගුණසංතුෂ්ටාඃ, ඔහුගේ ගුණයෙන් සන්තොෂයට පැමිණියාවූ; යතීන්ද්‍රාඃ, මහා සඞ්ඝයාවහන්සේ; තත්තපොධනං, ඒ තපස්විහු; ජිනශාසනවෘද්ධයෙ, සර්වඥශාසනාභිවෘද්ධිය පිණිස; උපසම්පත්තිං, උපසම්පදාවට; ප්‍රාපයන්ත, පැමිණවූවාහුයි.

( 30 )

ශරීරශොභයා ශරච් ඡශීව ස ප්‍රියො දෘශාම්
මුදාමුදාරවෛභවො නෘණාං නිකෙතනම් මහත්

ප්‍රමාණිකා නාම්

සඃ, ඒ යතීන්ද්‍රතෙම; ශරීරශොභයා, ශරීරකාන්තියෙන්; ශරත්ශශීව, ශරත්චන්ද්‍රයාමෙන්; දෘශාං, බලන්නවුන්ගේ නෙත්‍රයන්ට; ප්‍රියඃ, මනොඥවූයේයි; උදාරවෛභවඃ, මහත් ඓශ්චර්‍ය්‍ය ඇත්තාවූ; සඃ, ඒ තෙම; නෘණාං, මනුෂ්‍යයන්ගේ; මුදං, මහත්වූ සන්තොෂයට; මහත් නිකෙතනං, උතුම්වූ වාසභවනයක්වූයේයි.

( 31 )

සුරගුරු සදෘශො බුද්ධ්‍යා-දිනමණිරිව තෙජොභිඃ
හරිරිව බලසම්පත්ත්‍යා-ක්ෂිතිභෘදිව ගුරුත්වෙන

භුජඞ්ග ශිශුභෘතා නාම්

සඃ, ඒ තෙම; බුද්ධ්‍යා, ප්‍රඥාවෙන්; සුරගුරුසදෘශඃ, වෘහස්පති හා සමානවන්නේය; තෙජොභිඃ, තෙජසින්; දිනමණිරිව, ආදිත්‍යයා හා සමානවන්නේය; බලසම්පත්ත්‍යා, කායබල සම්පත්තියෙන්; හරිරිව, සිංහයෙකු හා සමානවන්නේය; ගුරුත්වෙන, ගුරුභාවයෙන්; ක්ෂිතභෘදිව, පර්වතයක් හා සමානවන්නේය.

( 32 )

අමුනා ජගති කෘතකෘත්‍යා
පෘථුනා තිලකෙන කුලස්‍ය
අගමද් ජනකශ්ච විවෘද්ධිම්
විධුනෙව පයොනිධිරුච්චෛඃ

මෙඝවිතාන නාම්

කුලස්‍ය, කුලයට; තිලකෙන, තිලකාභරණයක් වැනිවූ; පෘථුනා, මහත්වූ; අමුනා, මොහු

කරණකොටගෙණ; ජගතී, පෘථිවිතොමෝ; කෘතකෘත්‍යා, කෘතාර්ථවූවාය; ජනකශ්ච, පිතෘද; උච්චෛඃ, අත්‍යර්ථයෙන්; විවෘද්ධිං අගමත්, ධර්මශ්‍රවණාදි කුශලවෘද්ධියට පැමිණියේය; කුමක්මෙන්ද යත්—විධුනා, චන්ද්‍රයා කරණකොටගෙණ; පයොනිධිරිව, ක්ෂීරසාගරය මෙන්—

( 33 )

කායෙන වාචා මනසාච සත්වාන්
සම්ප්‍රීණයන් දුඃඛමපාස්‍ය දානෛඃ
ධර්මේප්‍රතිෂ්ඨාපයිතුං ප්‍රවෘත්තො
රම්‍යස්ථලග්‍රාමපතිර්‍යතීන්ද්‍රඃ—

ඉන්ද්‍රවජ්‍රා නම්—

රම්‍යස්ථලග්‍රාමපතිඃ, රම්මුංගොඩ විහාරයට අධිපතිවූ; යතීන්ද්‍රඃ, මේ යතීන්ද්‍රතෙම; කායෙන, කායද්වාරයෙන්ද; වාචා, වාග්ද්වාරයෙන්ද; මනසාච, මනොද්වාරයෙන්ද; සත්වාන්, සත්වයන්; සම්ප්‍රීණයන්, සතුටුකරමින්; දානෛඃ, දානය කරණකොටගෙණ; දුඃඛමපාස්‍ය, ඔවුන්ගේ කායික චෛතසික දුඃඛය දුරුකොට; ධර්මේ, දශකුශලධර්මයෙහි; ප්‍රතිෂ්ඨාපයිතුං, ධර්මදෙශනාකිරීමෙන් සත්වයන් පිහිටුවන්ට; ප්‍රවෘත්තඃ, පටන්ගත්තේය—

( 34 )

කරොති යස් තස්‍ය යතීශ්වරස්‍ය
ස්තුතිම් ප්‍රශස්තාමිහ ගද්‍යපද්‍යෛඃ
ස ධර්මකාමාර්ථමවාප්‍ය චිරා
දුපෛති නිර්වාණරතිං සුඛෙන—

උපෙන්ද්‍රවජ්‍රා නම්—

ඉහ, මේ ලොකයෙහි; යඃ, යම් කවිවරයෙක්තෙම; තස්‍ය යතීශ්වරස්‍ය, ඒ යතීන්ද්‍රයාට; ගද්‍යපද්‍යෛඃ, ගද්‍යපද්‍යරචනා විශෙෂයෙන්; ප්‍රශස්තාං, ශ්ලාඝ්‍යවූ; ස්තුතිම්, ස්තොත්‍රයක්; කරොති, කෙරේද; සඃ විද්වාන්, ඒ කවීශ්වරතෙම; ධර්මකාමාර්ථමවාප්‍ය, ධර්මකාමාර්ථ සම්පත්තියට පැමිණ; නිර්වාණරතිං, සතරවන පුරුෂාර්ථවූ මොක්ෂයෙහි අභිරතියට; සුඛෙන, සැපසේම; උපෛති, පැමිණේ—

( 35 )

යශොදයානන්දිත සච්ඡරීරො
ගොවින්දවච්ඡ්‍රීබලභද්‍රයුක්තඃ
සශඞ්කරශ් ශම්භුරිව ප්‍රජානාම්
බ්‍රහ්මෙව ධීරශ් චතුරානනොභූත්—

උපජාති නම්—

සඃ, ඒ යතීන්ද්‍රතෙම; ගොවින්දවත්, විෂ්ණුහු මෙන්; යශොදයා, යශොදා දෙවීන් විසින්; නන්දිත, සතුටුකරණලද; සත්ශරීරඃ, ශොභන ශරීර ඇත්තේ—නොහොත් මේතෙම; යශඃ, කීර්තියෙන්ද; දයා, කරුණාවෙන්ද; ආනන්දිත, සන්තොෂයෙන් පුරණලද; සත්ශරීරඃ, සත්පුරුෂ වර්ගයා ඇත්තේ; තවද—ශ්‍රී, ලක්ෂ්මිය හා; බලභද්‍ර, හලායුධයාගෙන්; යුක්තඃ, සංහිතවන්නේය; නොහොත්—ශ්‍රීබලභද්‍රයුක්තඃ, දෙහශ්‍රීන් හා මනාවූ කායශක්තියෙන් යුක්තවන්නේය; ශම්භුරිව, ඊශ්වරයාමෙන්; ශඞ්කරඃ, ශඞ්කරනම්වන්නේ; නොහොත්—ප්‍රජානාං, සත්වයන්ට; ශඞ්කරඃ, සැප ඇතිකරන්නේය; බ්‍රහ්මා ඉව, බ්‍රහ්මයාමෙන්; චතුරානනොභූත්, චතුර්මුඛවූයේය; නොහොත්—චතුරානනඃ, වාක්පටුත්වයෙන් යුක්තවූ මුඛ ඇතිවූයේය—

( 36 )

රම්‍යස්ථලග්‍රාමපතෙර් ගුණාවලිං
තස්‍යාභිධාතුම් භුවි කොස්ති කොවිදඃ
වක්තුං ස එව ප්‍රභවත්‍යපාන්නිධෙ
රම්භාංසි කුම්භෛඃ පරිමාති යඃ පුමාන්—

ඉන්ද්‍රවංශා නම්—

රම්‍යස්ථලග්‍රාමපතෙඃ, රම්මුංගොඩ විහාරයට නායකවූ; තස්‍ය, ඒ යතීශ්වරයාගේ; ගුණාවලිං, දානශීලාදි ගුණසමූහය; අභිධාතුං, කියන්නට; භුවි, ලොකයෙහි; කඃ කොවිදඃ, කවරනම් පණ්ඩිතකෙණෙක්; අස්ති, ඇද්ද; යඃ පුමාන්, යම් පුරුෂයෙක්; අපාංනිධෙඃ, සමුද්‍රයාගේ; අම්භාංසි, ජලයන්; කුම්භෛඃ, කලගණනින්; පරිමාති, ප්‍රමාණ

කෙරේද; සඃ එව, ඒ පුරුෂතෙමේම; වක්තුං, ඔහුගේ ගුණය කියන්ටත්; ප්‍රභවති, පොහොසත් වන්නේයි.

( 37 )

මහානෙත්‍ර ප්‍රාසාදඃ ප්‍රසාදී යතීන්ද්‍රඃ
කවීනාමාධාරඃ සර්වශාස්ත්‍රාර්ථවෙදී
සදා මෛත්‍රිධ්‍යානාශක්ත චිත්තප්‍රවෘත්තිර්
භජත්‍යුපෛවඃ ශාන්තිං මුක්තරාගාදි
දෝෂඃ.

### මඤ්ජරිකාවලී නම්.

ප්‍රසාදී, පැහැදීම් ඇත්තාවූ හෙවත් ශ්‍රද්ධාවෙන් යුක්තවූ; කවීනාං, කවිජනයාට; ආධාරඃ, ආධාරවූ; සර්වශාස්ත්‍රාර්ථවෙදී, සියලු ශාස්ත්‍රයෙහි අර්ථ දන්නාවූ; සදා, හැමකල්හි; මෛත්‍රිධ්‍යාන, මෛත්‍රි භාවනාවෙහි; ආශක්ත, ඇලුනාවූ; චිත්තප්‍රවෘත්තිඃ, චිත්තප්‍රවෘත්ති ඇත්තාවූ; මුක්තරාගාදිදෝෂඃ, හරණලද රාගද්වෙෂාදි පාපයන් ඇති; මහානෙත්‍රප්‍රාසාදඃ යතීන්ද්‍රඃ, මහානෙත්‍රප්‍රාසාදමූල මහාස්ථවිරතෙම; උපෛවඃ, අත්‍යර්ථයෙන්; ශාන්තිං, ඉන්ද්‍රියාදි සන්සිඳීම නොහොත් සමථභාවනාව; භජති, සෙවිනේයි.

( 38 )

මිත්‍රොදය ප්‍රමුදිතො විකචාබ්ජවක්ත්‍රඃ
සජ්ජීවනශ් චපලමීන දෘගත්‍යගාධඃ
සංසෙවිතඃ පදගතෛරපි රාජහංසෛඃ
සන්තාපහා මුනිරයං කමලාකරොභූත්.

### වසන්තතිලක නම්.

මිත්‍රොදය, ආදිත්‍යයාගේ උදාවීමෙන්; ප්‍රමුදිතඃ, ප්‍රසන්නවූ; නොහොත්–මිත්‍රොදයප්‍රමුදිතඃ, මිත්‍රයන්ගේ අභිවෘද්ධියෙහි ප්‍රසන්නවූ; විකච, ප්‍රබුද්ධවූ; අබ්ජ, පද්මයන්ම; වක්ත්‍රඃ, මුඛකොට ඇති; නොහොත්–විකච, විකසිතවූ; අබ්ජ, පියුම් බඳුවූ; වක්ත්‍රඃ, මුඛමණ්ඩල ඇති; සජ්ජීවනඃ, මනාවූ දිය ඇති; නොහොත් සජ්ජීවනඃ, සත්පුරුෂයන්ට ජීවිතයක් බඳුවූ; චපල, චඤ්චලවූ; මීනදෘක්, මත්ස්‍යයන් නමැති ඇස් ඇති; නොහොත්–චපලමීනදෘක්, චඤ්චලවූ මත්ස්‍යයන්ට බඳුවූ ඇස්ඇති; අත්‍යගාධඃ, අතලස්පර්ශවූ; නොහොත්–අත්‍යගාධඃ, ඉතා ගැඹුරුවූ ගුණඇති; පදගතෛඃ, ස්ථානගතවූ; රාජහංසෛරපි, හංසරාජයන් විසින්ද; සංසෙවිතඃ, මනාකොට සෙවුනාලද; නොහොත්–පදගතෛඃ, සවකීයවූ පාද සමීපයට පැමිණියාවූ; රාජහංසෛරපි, රාජශ්‍රේෂ්ඨයන් විසින්ද–අපි ශබ්දයෙන් ගෘහිත වෛශ්‍ය ශුද්‍රාදීන් විසින්ද–සංසෙවිතඃ, භාත්පසින් සෙවුනාලද; සන්තාපහා, ග්‍රීෂ්මසන්තාප දුරුකරන්නාවූ; නොහොත්–සන්තාපහා, සත්වයන්ගේ මනොදුඃඛය දුරුකරන්නාවූ; අයං මුනිඃ, මේ මුනීශ්වරතෙම; කමලාකරොභූත්, පද්මාකරයක් හා සමානවූයේයි; නොහොත්–කමලා, ලක්ෂ්මියට; ආකරොභූත්, උත්පත්තිස්ථානවූයේයි.

( 39 )

න භවති තව තුල්‍යොචෙතනඃ කල්පශාඛී
පශුරිති න ගතා සා කාමධෙනුස් සමත්වම්,
දෘශදිති සදෘශත්වං නෛති චින්තාමණිස්තෙ
ත්වදුපමිතිෂු තිස්ථං නාථ දාරිද්‍රමාසීත්.

### මාලිනී නම්.

නාථ, ස්වාමීන්වහන්ස; අචෙතනඃ, අචෙතස්කවූ; කල්පශාඛී, කල්පවෘක්ෂයතෙම; තව, නුඹවහන්සේට; තුල්‍යො න භවති, සදෘශනොවන්නේය; සා කාමධෙනුඃ, ඒ සුරභිධෙනුතොමෝ; පශුරිති, පශුජාතියයි කියා; සමත්වං, සදෘශභාවයට; නගතා, නොපැමිණියාය; චින්තාමණිඃ, චින්තාමාණික්‍යයතෙම; දෘශදිති, පාෂාණයයි කියා; තෙ, නුඹවහන්සේ හා; සදෘශත්වං න එති, සදෘශභාවයට නොපැමිණෙන්නේය; ඉත්ථංහි, මේ යථොක්ත ප්‍රකාරයෙන්; ත්වදුපමිතිෂු, නුඹවහන්සේට උපමා කිරීමෙහි; දාරිද්‍රං, දාරිද්‍රභාවය; ආසීත්, වූයේයි.

( 40 )

ධනද සඛශ් ස ධූර්ජටිරිව ක්ෂමාලිඞ්ගිතො
හරිරිව චන්ද්‍රමාඉව ලසත් කලානාං නිධිඃ
දශරථ භූමිජානිරිව සත්සුමිත්‍රාන්විතො
රවිරිව පඞ්කශොෂණකාරො මුනිශ් ශොභතෙ.

### වාණිනී නම්.

ධූර්ජටිරිව, ඊශ්වරයාමෙන්; ධනදසඛඃ, වෛශ්‍රවණයා මිත්‍රකොට ඇති; නොහොත්–ධනදසඛඃ,

වසතු දෙන්නවුන්ට මිත්‍රවූ; හරිරිව, විෂ්ණුහු
මෙන්; ක්‍ෂමාලිඞ්ගිතඃ, ක්‍ෂාන්ති ගුණයෙන් යුක්
තවූ; චන්ද්‍රමා ඉව, චන්ද්‍රයාමෙන්; ලසත්, තෙවු
නාවූ; කලානං නිධිඃ, ෂොඩශව්ධකලාවන්ට උත්
පත්තිස්ථානවූ; නොහොත්–ලසත්කලානාං, ප්‍රකා
ශවූ චතුෂ්ෂෂ්ටිකලාවන්ට; නිධිඃ, නිධානවූ; දශ
රථභූමිජානිරිව, දශරථරජහුමෙන්; සත්, යහ
පත්වූ; සුමිත්‍රාන්විතඃ, සුමිත්‍රානම් බිසවුන්ගෙන්
යුක්තවූ; නොහොත්–සත්, නුවනැත්තාවූ; සුමි
ත්‍රාන්විතඃ, කල්‍යාණමිත්‍රයන්ගෙන් යුක්තවූ; රවි
රිව, ආදිත්‍යයාමෙන්; පඞ්කශොෂණකරඃ, කාදීම
ශොෂණය කරන්නාවූ; නොහොත්–පඞ්කශො
ෂණකරඃ, රාගාදිපාප විනාශකරන්නාවූ; සඃ මුනිඃ,
ඒ මුනීශ්වරතෙම; ශොභතෙ, හොබනේසි.

( 41 )

**ක්‍ෂමාමුපගතොප්‍යයම් මුනිවරස් සුධර්මාශ්‍රිතො**
**භවත්සමදෘගීශ්වරො ප්‍යතරලොපි මුක්තාමයඃ**
**සදෘනවගුණාශ්‍රයො ප්‍යතුලසත්‍යභාමාන්විතො**
**වෘහද්විබුධනායකොප්‍යමිතගොත්‍ර රක්‍ෂාකරඃ.**

ප්‍රථ්වී නම්.

අයං මුනිවරඃ, මේ මුනිශ්‍රෙෂ්ඨතෙම; ක්‍ෂමාමුප
ගතොපි, භූමියට පැමිනියේද; සුධර්මාශ්‍රිතොභවත්,
සුධර්මානම් දිව්‍යසභාව ඇසුරුකරණලද්දේවිය ය
නුවිරුඬය; නොහොත්–ක්‍ෂමාමුපගතොපි, ක්‍ෂමා
ගුණයට පැමිනියේද; සුධර්මාශ්‍රිතොභවත්, ශොභ
නවූ ධර්මයන් ඇසුරුකරණලද්දේවිය යනු සවභා
වාර්ථය; ඊශ්වරොපි, මහදෙව්වූයේද; සමදෘක්,
යුග්මදෘෂ්ටි ඇත්තේය යනු විරුඬය; නොහොත්–
ඊශ්වරොපි, ප්‍රධානවූයේද; සමදෘක්, භවත්‍රයෙහි
සර්ව වස්තූන් අනිත්‍යාදි වශයෙන් සමානකොට
දක්නාවූ ඥාන ඇත්තේය යනු සවභාවාර්ථය; අත
රලොපි, හාරමධ්‍යග රත්න නැත්තේද; මුක්තා
මයඃ, මුක්තාඵලයෙන් නිෂ්පන්නවූයේය යනු
විරුඬය; නොහොත්–අතරලොපි, අචඤ්චලවූ
යේද; මුක්තාමයඃ, හරණලද රොගඇත්තේය
යනු සවභාවාර්ථය; දානවගුණාශ්‍රයොපි, අසුරයන්
ගේ ගුණයට ආධාරවූයේද; සඃ, ඒ දෛත්‍යගුරු
තෙම; අතුල, අසදෘශවූ; සත්‍යභාමාන්විතඃ, සත්‍ය
භාමානම් පත්නිය හා යුක්තව කෘෂ්ණවන්නේය
යනු විරුඬය; නොහොත්–සදා, හැමකල්හි; නව
ගුණාශ්‍රයොපි, අරහාදි නවගුණ ආශ්‍රයකොට පව
ත්නේද; අතුල, අසාධාරණවූ; සත්‍ය, සත්‍යවච
නය; භා, දෙහකාන්තිය; මා, ලක්‍ෂ්මිය යන මෙ
හින්; අන්විතඃ, යුක්තවූයේය යනු සවභාවාර්ථය;
වෘහත්, මහත්වූ; විබුධනායකොපි, ඉන්ද්‍රවූයේද;
අමිත, අපරිමිතවූ; ගොත්‍රරක්‍ෂාකරඃ, පර්වතයන්
රක්‍ෂාකරන්නේය යනු විරුඬය; නොහොත්–වෘ
හත් විබුධනායකොපි, බොහෝ පණ්ඩිතවරයන්
ට ශ්‍රෙෂ්ඨවූයේද; අමිතගොත්‍රරක්‍ෂාකරඃ, බොහෝ
ගොත්‍රයෙහි උපන්නවුන් රක්‍ෂාකරන්නේය යනු
සවභාවාර්ථයි.

( 42 )

**බුඞ් ශීල සමාධිමන්දිරමුජ්ඣිතාඛිල කිල්විෂම්**
**ශාන්තවෙශමශෙෂසත්වහිතාර්ථිමාත්ත**
**සමුද්භවම්**
**දානපාරමිතාසනදුඃඛිතලොක දුෂ්කෘතසන්තතිම්**
**සද්ගුණාභරණම් මුනීශ්වරමීදෘශං ජනතෙර්චය.**

හරනතීක නම්.

බුඞ්ශීලසමාධි, ප්‍රඥශීලසමාධියට; මන්දිරං, වාස
භවනවූ; උජ්ඣිත, හරණලද; අඛිලකිල්විෂම්,
සියලු පාපයන් ඇති; ශාන්තවෙශම්, සන්හුන්
වෙශ ඇති; අශෙෂසත්වහිතාර්ථිං, සියලු සත්වයන්ට
හිතපිණිස; ආත්තසමුද්භවම්, ගෘහීතප්‍රතිසන්ධි
ඇති: දානපාරමිතා, දානපාරමිතා බලයෙන්;
අසනා, නසනලද; දුඃඛිතලොක, දුක්පත්සත්වයන්
ගේ; දුෂ්කෘතසන්තතිං, පාපසමූහ ඇති; සත්ගු
ණාභරණං, මෛත්‍රික්‍ෂමොප ශමාදි ශොභන ගුණ
නමැති භූෂණයෙන් යුක්තවූ; ඊදෘශං මුනීශ්වරං,
මෙබඳු මුනිශ්‍රෙෂ්ඨයා; ජනතෙ, එඹා ජනසමූහය;
අර්චය, පූජාකර.

(43) ශෛලානන්තායතනාධිනාථ භවතස් සත්කීර්ති මුක්තාඵලෛර්
හාරං චාරු විකීර්ෂුරුත්තමගුණානාදත්තවාන් පද්මභූඃ
ආනන්ත්‍යම් ප්‍රසමීක්‍ෂ්‍ය තද්ගුණචයෙ තෙෂාඤ්ච නීරන්ධ්‍රතාම්
ආලස්‍යාද් ගගණාඞ්ගණෙ සමකිරත් තාන්‍යෙව භාති ධ්‍රැවම්—

ශාර්දූලවික්‍රීඩිත නම්—

ශෛලානන්තායතනාධිනාථ, ශෛලපාතවිහාරයට නායකවූ මහාස්ථවිරයන්වහන්ස; භවතඃ, නුඹවහන්සේගේ; සත්කීර්තිමුක්තාඵලෛඃ, ශොභන කීර්ති නමැති මුක්තාඵලයෙන්; හාරං, වැලයක්; චාරු, මනොඥකොට; විකීර්ෂුඃ, කරණුකැමැත්තාවූ; පද්මභූඃ, මහාබ්‍රහ්මයාතෙම; උත්තමගුණාන්, ශීලාචාරාදි සත්ගුණයන්ද්‍යෙහෝ නොහොත් උත්තම සූත්‍රයන්; ආදත්තවාන්; ගෘහණය කෙළේය; තද්ගුණචයෙ, ඒ යථොක්තවූ ගුණසමූහයෙහි; ආනන්ත්‍යං, අනන්තභාවයද; තෙෂාං, ඒ කීර්ති මුක්තාඵලයන්ගේ; නීරන්ධ්‍රතාංච, අවිච්ඡිද්‍රභාවයද; ප්‍රසමීක්‍ෂ්‍ය, බලා; ආලස්‍යාත්, අලසභාවයෙන්; ගගණාඞ්ගණෙ, ආකාශාඞ්ගණයෙහි; සමකිරත්, විසුරුවූයේය; තාන්‍යෙව, ඒ කීර්තිමුක්තාඵලයෝම; භාති, නක්‍ෂත්‍රභාවයට පැමිණියාහුයයි; ධ්‍රැවම්—මන්‍යෙ, හඟිමි—

(44) භවතඃ කුන්දකරීන්ද්‍ර චන්ද්‍රවිශදෙ සංසර්පිති ප්‍රායශො
යශසි ක්‍ෂීරසමුද්‍රමග්නමිව යත්ත්‍රෛලොක්‍ය මාසීත් තතඃ
ක්ව හි කෛලාසඉතීශ්වරඃ ක්ව ගිරිශඃ ක්වාසෞ ශශීතීශ්වරී
ශරජන්මාච හිමාචලඃ ක්ව ජනනීත්‍යුච්චෛස්තරා මබ්‍රවීත්—

මත්තෙභවික්‍රීඩිත නම්—

භවතඃ, නුඹවහන්සේගේ; කුන්ද, මාලති පුෂ්පයන් මෙන්ද; කරීන්ද්‍ර, ඓරාවණයාමෙන්ද; චන්ද්‍ර, චන්ද්‍රයාමෙන්ද; විශදෙ, නිර්මලවූ; යශසි, යශොරාශිය; ප්‍රායශඃ, බොහෝසේ; සංසර්පිති, පැතිරෙණ කල්හි; යත්, යම්හෙයකින්; ත්‍රෛලොක්‍යම්, ස්වර්ග මර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත භුවනත්‍රය; ක්‍ෂීරසමුද්‍රමග්නමිව, ක්‍ෂීරසාගරයෙහි ගැලුනාක්මෙන්; ආසීත්, විද; තතඃ, එහෙයින්; ඊශ්වරඃ, මහදෙව්තෙම; කෛලාසඃ ක්වහි ඉති, කෛලාසපර්වතය කොයිද; අබ්‍රවීත්, කීයේයි; ඊශ්වරී, පාර්වතීතොමෝ; ගිරීශඃ ක්ව, ඊශ්වරයා කොයිද; ශශී ක්වාසෞ ඉති, චන්ද්‍රයා කොතැන්හි වාසකෙරේදැයි; අබ්‍රවීත්, කීවාය; ශරජන්මාච, ෂණ්මුඛදෙවද; හිමාචලඃ ක්ව, හිමාලපර්වතය කොයිද; ජනනි ක්ව ඉති, ස්වභාමාතෘවූ උමාදෙවි කොයිදැයි; උච්චෛස්තරාං, අතිශයින් උස්කොට; අබ්‍රවීත්, කීයේය—

(45) පූතෙ සත්‍යෙන යත් තත් ප්‍රියහිතකථනාත් සම්මතෙ සර්වලොකෛඃ
ක්ලෙශානාං මූලනාශං විදධති සහසා මුක්තිමාර්ගොපදෙශාත්
මිථ්‍යාඛ්‍යාත්‍යා මතෙ තෙ පරුෂ පිශුනතාසත්ප්‍රලාපෛර්විහීනෙ
මානෙත්පාමූලනාථ ස්ථිතවත් වචනෙ කිං සුධාප්‍රාර්ථනෙන

ස්‍රග්ධරා නම්—

මානෙත්පාමූලනාථ, මානෙත්පාමූල මහාස්ථවිරයන්වහන්ස; සත්‍යෙන, සැබෑකීමෙන්; පූතෙ, පවිත්‍රවූ; තත්තත්ප්‍රියහිතකථනාත්, ඒ ඒ සත්වයන්ට ප්‍රියවූ වැඩසිදුකරණ බස් කීමෙන්; සර්වලොකෛඃ, සමස්ත ලොකවාසීන් විසින්ම; සම්මතෙ, මැනවැයි දත්තාවූ; මුක්තිමාර්ගොපදෙශාත්, මොක්ෂමාර්ගයට උපදෙස් දීමෙන්; සහසා, වේලෙච්ච; ක්ලෙශානාං, රාගාදි ක්ලෙශයන්ගේ; මූලනාශං, මූලනාශය; විදධති, කරන්නාවූ; මිථ්‍යාඛ්‍යාත්‍යා, මුසාවාදයන්ගෙන්; මතෙ, පමණින් යුක්තවූ; පරුෂ, නිෂ්ඨුර

වාක්‍යයෙන් හා; පිශුනතා, පෛශුන්‍යයෙන් හා; අසත්ප්‍රලාපෛඃ, සත්භින්නප්‍රලාපයෙන්; විහීනෙ, විරහිතවූ; තෙ, නුඹවහන්සේගේ; වචනෙ, යථොක්ත ගුණොපෙතවචනය; සති නවති, ලොකයෙහි පවතින් සිටිකල්හි; සුධාප්‍රාපිණෙන, එකම මාධුර්‍ය්‍යගුණයෙන් යුක්තවූ අමෘතය ප්‍රාර්ථනා කිරීමෙන්; කිං, කවර ප්‍රයොජනයෙක්ද.

(46) මොහ තමාංසි සර්‍වජගතාං හරන් සද්කුශලොපදෙශ කිරණෛඃ
දුඃඛිත සත්ත්ව කෛරව කුලප්‍රබොධමනුභාවයන්නනුපදං
වික්‍රමසිංහදෙව ජලධිප්‍රභූත හිමදීධිතිර් මුනිරයං
ශ්‍රීඝන ශාසනාද්‍රි ශිඛරාදුදෙති කවිචෘන්ද චිත්තනභසි.

ප්‍රභද්‍රක නම්.

**සද්කුශලොපදෙශකිරණෛඃ**, සද්ධ්‍යවූ නවලොකොත්තර ධර්‍මොපදෙශ නමැති රශ්මියෙන්; **සර්‍වජගතාං**, සමස්තලොකවාසීන්ගේ; මොහතමාංසි, අඥාන නමැති අන්ධකාරය; හරන්, දුරුකරන්නාවූ; අනුපදං, ක්‍ෂණක්‍ෂණයෙන්, දුඃඛිතසත්ත්ව, දුකට පැමිණි සත්ත්වයන් නමැති; කෛරවකුල, කුමුදුසමූහයාගේ; ප්‍රබොධං, ප්‍රබොධකිරීම; අනුභාවයන්, සම්පාදනයකරන්නාවූ; වික්‍රමසිංහදෙව, වික්‍රමසිංහදෙව අමාත්‍ය නමැති; ජලධි ප්‍රභූත, ක්‍ෂීරසාගරයෙන් පහළවූ; හිමදීධිතිඃ, චන්ද්‍රයා සමානවූ; අයම්මුනිඃ, මේ මුනිශ්‍රෙෂ්ඨතෙම; ශ්‍රීඝනශාසනාද්‍රිශිඛරාත්, සර්‍වඥශාසන නමැති උදයපර්‍වත මස්තකයෙන්; කවිචෘන්ද, කවිසමූහයාගේ; චිත්තනභසි, සිත්නමැති ආකාශයෙහි; උදෙති, පහළවන්නේය.

(47) මුනිවර භාරතී තව සදා විභාති මුඛපඞ්කජෙ සුවිශද
වපුෂි මනොහරෙ සරසිජා ගුණෛරනුගතා චලාපි වසති
සහ රමසෙ විරක්තියුවතී ජනෙන පුනරිච්ඡසි ප්‍රියතමා
මනවරතං විමුක්තිමනඝප්‍රභො වද යතීශ්වරඃ කථමහූඃ.

අශ්වලලිත නම්.

**මුනිවර, මුනීශ්වරයානන්වහන්ස**; තව, නුඹවහන්සේගේ; මුඛපඞ්කජෙ, මුඛපද්මයෙහි; සුවිශද, අතිශයින් නිර්මලවූ; භාරතී, සරස්වතීතොමෝ; සදා, හැමකල්හි; විභාති, බබලන්නීය; මනොහරෙ, ජනනයන මනොරසායනවූ රූපශ්‍රීසෞභාග්‍යයෙන් මනොඥවූ; වපුෂි, ශ්‍රීශරීරයෙහි; ගුණෛඃ, ශීලාචාරාදී ගුණයෙන්; අනුගතා, අනුවර්ත්තීව පවත්නාවූ; චලාපි, චඤ්චලවූද; සරසිජා, ලක්‍ෂ්මීතොම, වසති, වාසයකරන්නීය; විරක්තියුවතීජනෙන, සංසාරයෙහි නිස්පෘහාසඞ්ඛ්‍යාත කාන්තාවන් හා සමග, රමසෙ, සිත්අලවා වාසයකරන්නෙහිය; පුනඃ, නැවත; විමුක්තිංප්‍රියතමාං, විශෙෂවූ නිරුපධිශෙෂ; විමුක්තිලක්‍ෂණකාන්තාව; අනවරතං, නිරන්තරයෙන්; ඉච්ඡසි, කැමැතිවන්නෙහිය; අනඝ, මහොඝෝ අපූර්‍වයෙක; ප්‍රභො, ස්වාමීන්වහන්ස; ත්වං, නුඹවහන්සේ; කථං යතීශ්වරඃඅහූඃ, ඉන්ද්‍රියවිජයෙන් යුක්තවූ යතිගණයාට කෙසේ නායකවූසේක්ද; වද, වදාළමැනවි.

(48) ශාස්ත්‍රපයොධිප්‍රතරණ තරණීර්‍යාචක චාතක ජලධර මාලා
ව්‍යාධිත වෛද්‍යඃ කෘශජනජනකඃ කාපථගාමී තෘෂිතකුලගඞ්ගා
ආතපදග්ධාධ්වග පථිවිටපී ත්‍රස්තවයාභය විතරණරාමඃ
ශාසනධුර්‍ය්‍යස් ත්වමසි භගවනො වික්‍රමසිංහ කුල කමල සූර්‍ය්‍යඃ.

තන්වී නම්.

**වික්‍රමසිංහකුල**, වික්‍රමසිංහ දෙවොත්තමයානන්ගේ වංශනාමැති; කමල, පද්මවනයට; සූර්‍ය්‍යඃ, ආදිත්‍යයා සමානවූ ස්වාමීන්වහන්ස; ත්වං, නුඹවහන්සේ; ශාස්ත්‍ර, ත්‍රිපිටකතර්කව්‍යාකරණාදි සමස්තශාස්ත්‍ර නමැති; පයොධිප්‍රතරණ, සමුද්‍රය එතරවීමට; තරණීඃ, නෞකාවක් සමානවනසේක; යාචක, යාචක

ජනනමැති; චාතක, චාතකපක්‍ෂිසමූහයාට; ජලධරමාලා, මෙඝමාලාවක්හා සමානවනසේක; ව්‍යාධිත වෛද්‍යඃ, ව්‍යාධිපීඩිතයන්ට වෛද්‍යයෙක් බඳුසේක; කෘශජන, දරිද්‍රජනයාට; ජනකඃ, පිතෘස්ථානීය වන්සේක; කාපථගාමි, කුතරමගයන්නාවූ; තෘෂිතකුල, පිපාසිතජනසමූහයාට; ගඞ්ගා, ගඞ්ගාවක්හා සමානවනසේක; ආතපදග්ධ, අව්වෙන්වියලුනාවූ; අධ්වග, මගීජනයාට; පථවිටපී, මාර්ගයෙහි ඡායාවෘක්‍ෂයක්හා සමානවනසේක; ත්‍රස්තවය, භයපත්වූ ජනසමූහයාට; අභයවිතරණ, අභයදානයෙහි; රාමඃ, රාමයා හා සමානවනසේක; භගවතඃ, භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේගේ; ශාසනධුර්‍ය්‍යඃ, ශාසනධුරන්ධර වනසේක.

(49) තිෂ්ඨති විද්‍යා යත්‍ර නවෘත්තං තදපිච යදි නහි වචනචතුරතා
වාක්පටුතාචෙත් නෛව සුබොධො යදි මනති න පරමවගමයති සඃ
යද්‍යපි වීර්‍ය්‍යං සාධු න භාග්‍යං තදපි යදි භවති න කුශලසඛිතා
නාථ යදිත්ථං නෛකත්‍රාස්තෙ ත්වයි පුනරසදෘශි තදඛිලමධුනා.

ක්‍රෞඤ්චපදා නම්.

යත්‍ර, යම්තැනෙක්හි; විද්‍යාතිෂ්ඨති, විද්‍යාවපවත්නේද; තත්‍ර, ඒතැන්හි; වෘත්තං න, ආචාරයනැත්තේය; තදපිච, ඒ වෘත්තයඇත්නමුදු; වචනචතුරතානහි, වාක්පටුත්වයනැත්තේය; වාක්පටුතාචෙත්, වාක්පටුත්වය ඇත්නමුදු; සුබොධොනෛව, තත්වඥානය නැත්තේය; යදි, ඉදින්; මනති, තෙමේ දන්නේනමුදු; සඃ, ඒ තෙම; පරංනඅවගමයති, පරප්‍රබොධයට සමර්ථනොවන්නේය; යද්‍යපි, ඉදින්; වීර්‍ය්‍යං, වීර්‍ය්‍යඇත්නමුදු; සාධුනභාග්‍යං, යහපත්භාග්‍යය නැත්තේය; තදපිචයදි, ඉදින් ඒ භාග්‍යයඇත් නමුදු; කුශලසඛිතා න භවති, කල්‍යාණමිත්‍රධර්මය නැත්තේය; නාථ, ස්වාමිනි; යත්, යම්ගුණබාහුල්‍යයෙක්; ඉත්ථං, මෙසේ; එකත්‍රන, එකතැනෙක්හි නොපවත්නේනම්; අධුනා, දැන්; තදඛිලම්පුනඃ, ඒ සියලුගුණ බාහුල්‍යවනාහි; අසදෘශි, අසමානවූ; ත්වයි, නුඹවහන්සේ කෙරෙහි; ආසෙත, පවත්නේය.

(50) දත්තාශෙෂ ත්‍යක්තක්ලෙශ ප්‍රමුදිතහෘදයසරසිජ ප්‍රියාප්‍රියවර්ජිත
ප්‍රඥාසින්ධො විවද්බන්ධො ත්‍රිපිටකධර ධරණිසුර ප්‍රසාදවිධායක
විද්‍යායුක්ත ව්‍යාඛ්‍යාශක්ත භ්‍රමහර නෘපතිකුලගුරො යතීන්ද්‍ර චිරම්මුදා
ජීයාඃශ්‍රීමානෙත්‍රපාමූල ස්ථවිරවර පරහිතරත ක්‍ෂමාභරණ භූෂණ.

භුජගවිජෘම්භිත නම්.

දත්තාශෙෂ, දානවිෂයෙහි දෙනලද සියලුවස්තු ඇති; ත්‍යක්තක්ලෙශ, හරණලද සියලුරාගාදි ක්ලෙශයන්ඇති; ප්‍රමුදිතහෘදයසරසිජ; එහෙයින්ම සන්තොෂයෙන් විකසිතවූ හෘදයපද්මයක් ඇත්තාවූ; ප්‍රියාප්‍රියවර්ජිත, ශත්‍රුමිත්‍රරහිතවූ; ප්‍රඥාසින්ධො, ප්‍රඥාවට විපුලාධාරත්වයෙන් සමුද්‍රයක්වැනිවූ; විවද්බන්ධො, කවිජනයන්ට බන්ධුභූතවූ; ත්‍රිපිටකධර, සූත්‍රාභිධර්මවිනය සංඛ්‍යාත පිටකත්‍රයධරන්නාවූ; ධරණිසුරප්‍රසාද විධායක, බ්‍රාහ්මණජනයන්ට දානාදිවශයෙන්ප්‍රසාදකර්තෘවූ; විද්‍යායුක්ත, සමස්තවිද්‍යායෙහි අභ්‍යාසඇත්තාවූ; ව්‍යාඛ්‍යාශක්ත, ධර්මව්‍යාඛ්‍යානයෙහි ඇළුම්ඇත්තාවූ; භ්‍රමහර, එහෙයින්ම සදුපදෙශ කරණයෙන් අස ත්නවුන්ගේ මතිභ්‍රමදුරුකරන්නාවූ; නෘපතිකුලගුරො, රාජකුලයට ගුරුවූ; පරහිතරත, පරාර්ථකරණ යෙහි අභිලාෂඇත්තාවූ; ක්‍ෂමාභරණභූෂණ, අතිශයවූ ක්‍ෂමානමැති ආභරණඇත්තාවූ; යතීන්ද්‍ර, යති ශ්‍රෙෂ්ඨවූ; ශ්‍රීමානෙත්පාමූලස්ථවිරවර, ශ්‍රීමත්වූ මානෙත්පාමූලමහාස්ථවිරොත්තමයානන්වහන්ස; මුදා, සන්තොෂයෙන්; චිරං, බොහෝකාලයක්; ජීයාත්, ජීවත්වුවමැනවි.

(51) කනක රජතපට්ටවස්ත්‍රාද්‍යභීෂ්ටාර්ථ සම්පාදනාල්පීකෘතානෙක කල්පද්‍රුමො
විදිත නිඛිලබොධි මාර්ගොපදෙශක්‍රමො භාවනාලීනචෙතා මහාවීර්‍ය්‍යවාන්
පරම සුකෘතිගුම්ඵිතාත්‍යන්තශාන්ත ස්වභාවඃ ප්‍රශංසාප්‍රශංසාසු සාධාරණො
ජගදුපකෘතයෙ චිරඤ්ජීයාදෙෂ තන්ද්‍යාද්‍යමග්‍රාමනාථො යතීන්ද්‍රඃ කෘපා වාරිධිඃ.

චණ්ඩවෘෂ්ටිප්‍රපාත නම්.



